# මැතිවරණ කොමිෂන් සභාව

## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல்: 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)

தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய(10107)

*web : www.elections.gov.lk e-mail : info@elections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය :EC/ EDR / PE /2020/4<br>எனதுஇல. | ඔබේ අංකය :<br>உமதுஇல. | දිනය : 2020.03.03<br>திகதி. |

(இதன் தமிழ் மொழிபெயர்ப்பு மறுபக்கத்தில் உள்ளது)

ලේඛනගත තැපෑල

**චක්‍රලේඛ අංක 03**

**ඉතා වැදගත්**

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,**
**සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,**
**ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්,**
**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,**
**සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන් / පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,**
**සියලුම රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් / සාමාන්‍යාධිකාරීවරුන්,**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.04.25**
**රජයට සහ රාජ්‍ය සංස්ථාවලට / ව්‍යවස්ථාපිත ආයතනවලට අයත් දේපළ මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම / උසස් කිරීම / මාරු කිරීම සීමා කිරීම**

පාර්ලිමේන්තු මැතිවරණය 2020.04.25 දින පැවැත්වීමට නියමිතය. ඒ සඳහා වන නාමයෝජනා කැඳවීමේ දැන්වීම 2020.03.02 දින ප්‍රසිද්ධ කර ඇත. එදින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් වූ කාල සීමාව “ඡන්ද විමසීමේ කාල සීමාව” ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 වන ව්‍යවස්ථාවේ සඳහන් වේ. මෙම කාලසීමාව තුළ දී දේශපාලන පක්ෂ / ස්වාධීන කණ්ඩායම් / අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හේතුවන නැතහොත් වෙනත් දේශපාලන පක්ෂ / ස්වාධීන කණ්ඩායම් / අපේක්ෂකයන් අගතියට පත්වන ආකාරයේ කටයුතු සඳහා රාජ්‍ය දේපළ භාවිතා කිරීමෙන් වැළකිය යුතු බව හා සියලුම දිස්ත්‍රික්කවල රජයේ නිලධරයන් / සේවකයන් බඳවා ගැනීම්/ උසස් කිරීම්/ මාරු කිරීම් යනාදී කරුණු සීමා කළ යුතු බව රාජ්‍ය දේපළ හා වර්තමාන පාලනය භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන් ප්‍රමුඛ සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම් වස් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ. (4) (අ) අනු ව්‍යවස්ථාවන් අනුව “මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්” යම් දේශපාලන පක්ෂයක් / ස්වාධීන කණ්ඩායමක් / අපේක්ෂකයෙක් හෝ තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක්, අපේක්ෂකයෙකු හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ. (4) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්

ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී. එමෙන්ම ස්වකීය පාලනය යටතේ ඇති සියලුම රාජ්‍ය නිලධාරීන් මෙම නියමයට අනුකූලව ක්‍රියාකරන බවට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු ය. මෙම නියම, සියලුම රජයේ අමාත්‍යාංශ, කොමිෂන් සභා, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්ව විද්‍යාල යනාදී සියලුම රජයේ ආයතනවලට හා රජයට පවරා ගෙන ඇති සමාගම්වලට ද බලපැවැත් වේ.

03. (i) මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජය සතු වාහන, හෙලිකොප්ටර් සහ ගුවන් යානා මැතිවරණ අවස්ථාවල දී යොදවා ගන්නා බවට මෙම කොමිෂන් සභාවට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාල සීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි. නිලධාරීන්ට වෙන් කර ඇති (Assigned vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරී කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතුය. මෙම කාල සීමාව තුළ දී නිලධාරීන්ට වෙන්කර ඇති වාහන (Assigned vehicles) හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අනිකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගත යුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා නොයෙදෙන බවට සෑහීමකට පත්විය යුතුය. රාජකාරි කටයුතු සඳහා යෙදවූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් යොදා තිබූ අවස්ථා පසුගිය ඡන්ද විමසීම්වල දී වාර්තා වී ඇති හෙයින් එවැනි ව්‍යාජ කරුණු සඳහා රජයේ වාහන නොයෙදවීමට වගබලා ගත යුතු වේ.

(ii) ගරු ජනාධිපතිවරයාගේ ආරක්ෂක අංශය සඳහා වෙන් කර ඇති වාහන දෙකකට හැර වෙනත් කිසිඳු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන් කරනු ලැබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිඳු කැබිනට් අමාත්‍යවරයෙකුට, රාජ්‍ය අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හෝ වෙනත් කිසිවකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකි ය. එබැවින් සියලු දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන සතු වාහන, ගරාජ අංක වලින් (ව්‍යාජ අංකවලින්) ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතු වාහන සංචිත භාර නිලධාරීන් නිසැක විය යුතු ය.

04. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වේ. එම නිසා එම ගොඩනැගිලි දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතු ය. සාමාන්‍ය කාල සීමාව තුළදී ඕනෑම දේශපාලන පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට මුදල් ගෙවා වෙන්කර ගත හැකි ගොඩනැගිලි හා ශාලා, ඡන්ද විමසීම් කාල සීමාව තුළ නිසි පරිදි ගාස්තු අයකර කිසියම් දේශපාලන පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට වෙනස්ව සැලකීමකින් තොරව ලබාදීමට මෙම විධාන වලින් බාධාවක් ඇති බව නොසැලකිය යුතු ය. මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් බව ද සැලකිය යුතු ය. තවද සියලු පළාත්වල පිහිටි රජයේ හෝ රාජ්‍ය ආයතන සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන යනාදිය කිසිඳු දේශපාලනඥයකුට, නිලධරයකුට, වෙනත් පුද්ගලයෙකුට ඡන්ද විමසීම් කාලසීමාව තුළ පූර්ණකාලීනව වෙන් කර දීමෙන් වැළකිය යුතු ය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරත වීමට ඉඩ නොදිය යුතු ය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර් කටවුට් ආදිය ප්‍රදර්ශනය සඳහා භාවිතා කිරීමට ද ඉඩ නොදිය යුතු ය.

05. රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා පිටි හෝ හිස් ඉඩම් හා ශාලා හෝ ඒවැනි වෙනත් ගොඩනැගිලි එක් එක් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්/ හා අපේක්ෂක ප්‍රවර්ධන ප්‍රචාරක රැස්වීම් සඳහා වෙන් කිරීමේදී කිසිදු පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට විශේෂ සැලකිල්ලක්, ප්‍රමුඛතාවක් හෝ අඩු සැලකිල්ලක් ලැබෙන පරිදි වෙන් කරදීම් නොකළ යුතුය. එකී ස්ථාන, ගොඩනැගිලි වෙන්කර දීම විනිවිධභාවයකින් යුතුව සිදුකල යුතු ය. එවැනි ස්ථාන සෙසු දේශපාලන පක්ෂයකට/ ස්වාධීන

කණ්ඩායමකට/ අපේක්ෂකයෙකුට ලබා ගැනීමට නොහැකි වන පරිදි, කිසිදු ස්වාධීන කණ්ඩායම්/ හා අපේක්ෂකයෙකුට හෝ වෙනත් කාර්යයක් සඳහා දිගින් දිගටම වෙන්කර තැබීම නොකළ යුතුයි.

06. කිසිදු නිලධාරියෙකුට හෝ සේවකයකුට දේශපාලනමය කටයුතු සඳහා රාජ්‍ය දේපළ එනම්, වාහන, ප්‍රචාරක උපකරණ, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මාධ්‍ය උපකරණ, දූරකථන පහසුකම්, ලිපි ද්‍රව්‍ය, සංචාරක නිවාස යනාදී හෝ වෙනත් රජයේ සේවකයෙක් දේශපාලන කටයුතු සඳහා යොදවා ගැනීමේ හිමිකමක් හෝ රජය සතු කිසිවක් භාවිතා කිරීමේ හිමිකමක් නැත. එසේ කිරීම නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදකි.

07. (i) ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ මුල්ගල් තැබීම්, විවෘත කිරීම, ජනතා අයිතියට පැවරීම්, ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි වැනි උත්සව ආදිය දේශපාලනඥයින් සහභාගිත්වයෙන් සිදු කිරීමේ දී නැතහොත් පැවැත්වීමේ දී ඡන්ද විමසීමට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශවීමට හා එමගින් අයුතු දේශපාලන වාසි ලබා ගැනීමට අවකාශ සැළසේ. මෙවැනි උත්සව පැවැත්වීමෙන් යම් දේශපාලන පක්ෂයක්/ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනත් දේශපාන පක්ෂයක්/ ස්වාධීන කණ්ඩායමක්/ අපේක්ෂකයකුට අගතියක් වන බවට පැමිණිලි ලැබිය හැකි හෙයින් මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු උත්සව අවස්ථා පැවැත්වීමෙන් වැළකී සිටීම අවශ්‍ය බව පෙන්වා දෙනු කැමැත්තෙමි. යම් හෙයකින් නාමයෝජනා දැන්වීම නිකුත් කිරීමට පෙර, එම දිනයට ඉතා ආසන්න දිනවල මෙවැනි කාර්යයන් සඳහා අවශ්‍ය සංවිධාන කටයුතු සිදුකරනු ඇත්තේ එකී උත්සව වුව ද පැවැත්විය යුත්තේ මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මැතිවරණ කොමිෂන් සභාව නියම කරන කොන්දේසිවලට යටත්ව ය. තවද, මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යාවශ්‍ය ජංගම සේවා මෙම ඡන්ද විමසීම් කාලසීමාව තුළ පැවැත්වීමට, ඡන්ද විමසීමට අදාළ නාමයෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කිරීමට පෙර නියම කරගෙන ඇත්නම් එවැනි අවස්ථා පිළිබඳව වහාම මැතිවරණ කොමිෂන් සභාව වෙත දැන්වීමට ක්‍රියා කළ යුතු වේ. එවිට ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙනු ඇත.

(ii) ඡන්ද විමසීම් කාලය තුළ යම් හෙයකින් රජයේ මුදල් වැය කරමින් මෙවැනි උත්සව පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවක දී කිසියම් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත් කිරීම් සිදු වුවහොත් ඒ පිළිබඳව උත්සවය සංවිධානය කරන ලද නිලධාරීන් වග කිවයුතු ය. එමෙන්ම ඡන්ද විමසීම් කාලය තුළ පැවැත්වෙන මෙවැනි උත්සව සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුම්වත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළ යුතු ය. මෙවැනි උත්සවයක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා හෝ අගතියට පත් කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදු කිරීම, ධජ/ පතාක/ පෝස්ටර්/ පත්‍රිකා/ දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් අතර එවැනි කාර්යයන් වැළැක්වීමට අදාළ උත්සව සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

(iii) එමෙන්ම, ඡන්ද විමසීම් කාලය තුළ යම් හෙයකින් රජයේ මුදල් වැය කරමින් මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදිය පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත්කිරීම් සිදුවුවහොත් ඒ පිළිබඳව අදාළ කාර්යය සංවිධානය කරන ලද නිලධාරීන් වගකිව යුතු ය. ඡන්ද විමසීම් කාලය තුළ පැවැත්වෙන මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදිය සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුම්වත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළ යුතුය. එසේ වුවත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් හෝ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජංගම සේවා සඳහා මෙම සීමා කිරීම බලනොපැවැත්වේ. මෙවැනි ජංගම සේවා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පමණක් පැවැත්වීමට වගබලා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ.මෙවැනි කිසිදු ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළියක දී හෝ එවැනි වෙනත් අවස්ථාවක දී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා නැතහොත් අගතියට පත්කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදුකිරීම, ධජ/ පතාක/ පෝස්ටර්/ පත්‍රිකා/ දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් අතර එවැනි කාර්යයන් වැළැක්වීමට අදාළ කාර්යය සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

(iv) ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඉඩම් කච්චේරි පැවැත්වීම, හදිසියේ සංවිධානය කෙරෙන රජයේ ඉඩම් බෙදා දීම්, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම්, වැව්ලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්ය බල විදුලි පහන්, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම් / වන්දි මුදල් ප්‍රදානය කිරීම් වැනි වැඩසටහන් අත්හිටුවිය යුතුය. එසේ ලබා දෙන බවට රාජ්‍ය නිලධාරීන් විසින් නිවේදන නිකුත් කර ඒ සඳහා ලැයිස්තු සකස් කිරීමද මෙම කාලසීමාව තුළ නොකළ යුතුය. මක්නිසාදයත්, එවැනි කාර්යයන් මගින් ඡන්ද දායකයන්ට සංග්‍රහ කිරීමේ වරද සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයින් හා මෙවැනි ව්‍යාපෘති හා වැඩසටහන් මගින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් ප්‍රවර්ධනය සිදු කරන බවට පැමිණිලි ලැබෙන බැවිනි.

(v) තවද, ඡන්ද විමසීම් කාලය තුළ නිවාස ණය ආධාර ලබා දීම සඳහා ආකෘති පත්‍ර බෙදා හැරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දීම සඳහා ආකෘති පත්‍ර බෙදා හැරීම වැනි කටයුතු සිදු කිරීමද අත්හිටුවිය යුතුය.

(vi) එසේ වුවද කල්තැබිය නොහැකි හදිසි ව්‍යාපෘති / වැඩසටහන් සඳහා දැනටමත් දින නියම කර තිබේ නම් හෝ හදිසි විශේෂිත අවශ්‍යතාවක් ඇති වුවහොත් හෝ ඒ සම්බන්ධයෙන් මා වෙත දන්වා එවිය යුතුය. එවිට ඒ පිළිබඳව සුදුසු උපදෙස් නිකුත් කරනු ලැබෙනු ඇත. එවැනි ව්‍යාපෘති / වැඩසටහන් වුවද ක්‍රියාත්මක කළ යුත්තේ කිසිදු දේශපාලන පක්ෂයක / ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයෙකුට විශේෂ වාසියක් (හෝ අගතියක්) නොවන පරිදි වන බවත්, ඒ සඳහා නිලධාරීන් පමණක් සහභාගී විය යුතු බවත් සැලකිය යුතුය.

08. *(i)* සියලු රජයේ නිලධාරීන්ගේ හැකියාව, දැනුම හා ඔවුන්ගේ කාලය ද රාජ්‍ය දේපළක් ලෙස සැලකෙයි. දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයකු වුවද ස්වකීය කාර්යාල වේලාව තුළ හෙවත් රාජකාරියට වාර්තා කර ඇති වේලාව තුළ හෝ රාජකාරි නිවාඩු ලබාගෙන ඇති විට හෝ කාර්යාලය තුළ හෝ කාර්යාලයෙන් බැහැරව දේශපාලනමය ප්‍රවර්ධන කටයුතුවල නොයෙදිය යුතු ය. දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධාරීන් නිවාඩු ලබාගෙන හෝ දේශපාලනමය කාර්යයන්හි නිරත නොවිය යුතු ය. එසේ නිරත වන්නේ නම් පූර්වයෙන් පෞද්ගලික හෝ විශේෂ නිවාඩු අනුමත කරගත යුතු වේ.

*(ii)* අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ මාණ්ඩලික නිලධාරීන්, සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල මාණ්ඩලික නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් / වන නිලධාරීන් වැනි සාම නිලධාරීන් හා ආරක්ෂක අංශවල සාමාජිකයින් ස්වකීය කාර්යාල වේලාවල තුල පමණක් නොව කාර්යාල වේලාවෙන් බැහැරව මෙන්ම නිවාඩු දිනවලදී වුවද වක්‍රව හෝ සෘජුව හෝ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන ආකාරයේ නැතහොත් අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම් වලට සහභාගී වීමෙන් හෝ ඒවාට අනුබල දීමෙන් හෝ වැලකී සිටිය යුතුය. එනම්, දේශපාලන අයිතිවාසිකම් රහිත සියලුම නිලධාරීන්ට දේශපාලනයමය කටයුතුවල යෙදීමට අවසර නොමැති බවට වූ නියමය ඉතා තදින් බලාත්මක කළ යුතුය.

(iii) දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධරයෙකු තම පෞද්ගලික සමාජ ජාල ගිණුමක් හෝ වෙනත් ගිණුමක් භාවිතාකරමින් යම් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන කිසිදු ප්‍රචාරණයක් හෝ ප්‍රකාශයක් සිදු කිරීම වරදක් වන්නේය. දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධාරියෙකු වුවද එම ප්‍රචාරණයන් හා ප්‍රකාශයන් සඳහා රජයේ සම්පත් භාවිතා කරමින් හෝ සිය පෞද්ගලික සමාජ ජාල ගිණුම් හරහා සිදු කිරීම නොකළ යුතු අතර වෛරී ප්‍රකාශ, දූස් තොරතුරු හා සාවද්‍ය තොරතුරු මුදා හැරීම හෝ ප්‍රසිද්ධියට පත් කිරීමට ඉඩ හැරීම වරදක් වේ.

(iv) සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන් ද මෙම ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී කිසිදු දේශපාලන පක්ෂයක් , ස්වාධීන කණ්ඩායමක් අපේක්ෂකයෙක් හෝ අපේක්ෂකයෙකු *හෝ ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වල යෙදීමෙන් වැළකී සිටිය යුතුය.*

09. (i) මෙම ඡන්ද විමසීම ඉලක්ක කරගනිමින් යම් දේශපාලන පක්ෂයක්/ ස්වාධීන කණ්ඩායමක්/ අපේක්ෂකයෙක්/ ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන ආකාරයෙන් රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා

ගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ. පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම් / උසස් කිරීම්/ ස්ථාන මාරු කිරීම් වලට අදාළ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් කල් දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතු යැයි අමාත්‍යාංශ ලේකම්වරයා හෝ පත්වීම් බලධරයා හෝ අපේක්ෂා කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළව කරනු ලබන පත්වීම් විධිමත්ව, දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සිදු කළ යුතු අතර, එවන් බඳවා ගැනීම් / උසස් කිරීම්/ ස්ථාන මාරු කිරීම් සඳහා ද කොමිෂන් සභාවට අදාළ කරුණු ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. එමෙන්ම ඒ ඒ පළාත් සභාවල හෝ පළාත් පාලන ආයතනවල හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම් / උසස් වීම් ලබා දීම/ ස්ථාන මාරු කිරීම් සඳහා නාමයෝජනා දැන්වීම නිකුත් කිරීමට පෙර ආරම්භ කර තිබූ ක්‍රියාදාම වුව ද අත්හිටුවීමකින් තොරව ක්‍රියාකළ යුතු නම් ඒ පිළිබඳ අදාළ සියලු විස්තර එනම් ක්‍රියාදාමය ආරම්භ කිරීම, සාධාරණීකරණය කිරීම, නිසි බලධාරි වෙතින් අනුමැතිය ලැබීම, ඉල්ලුම්පත් කැඳවීම යනාදියට අදාළ සියලු කරුණු ද දක්වමින් අනුමැතිය ඉල්ලා සිටිය යුතුය. එවැනි විටක දී අනුමැතිය ලබා දෙන්නේ දේශපාලන මැදිහත්වීමෙන් තොරව, විධිමත් ලෙස ඉල්ලුම්පත් කැඳවා ඇති බව සනාථ කළ හැකි නම් පමණකි.

(ii) සනීපාරක්ෂක, පිරිසිදු කිරීම් සේවා හා නඩත්තු කටයුතු හා කැළිකසල ඉවත් කිරීම් යනාදි අත්‍යවශ්‍ය කාර්යයන් බිඳ වැටීම වැළැක්වීම සඳහා හා අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීයව හෝ පළාත්බද රාජ්‍ය සේවයට සේවකයින් හදිසි බඳවා ගැනීම් කිරීමට වුව ද සවිස්තර කරුණු දන්වා මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. මෙම සියලුම කරුණු කිසිදු දේශපාලනමය මැදිහත් වීමකින් තොරව විනිවිද බවින් යුතුව, එවැනි කටයුතු සිදු කල යුතු අතර තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ අදාළ සියලු කරුණු ඕනෑම පුරවැසියෙකුට ලබා ගැනීමට හැකි බවත්, ජනමාධ්‍ය, සිවිල් සංවිධාන හා ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ මෙවැනි කරුණු කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන බවත් සැමවිටම සිහිතබා ගත යුතුය.

(iii) තවද පාර්ලිමේන්තු මැතිවරණ සඳහා වන ගැසට් නිවේදනය 2020.03.02 වන දින නිකුත් කර ඇති බැවින් එම දිනයට පෙර දින යොදා පෙරදාතම් කොට පත්වීම් ලිපි / උසස් කිරීම් සහ බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීම් සිදුවන බවට මැතිවරණ කොමිෂන් සභාවට පැමිණිලි ලැබී ඇති බැවින් එවැනි ආකාරයේ කාර්යයන් සිදු කිරීම කිසිසේත්ම නොකළ යුතු බව දැඩි ලෙසම අවධාරණය කරනු ලැබේ.

(iv) ඡන්ද විමසීම් කාල සීමාව තුළ රාජ්‍ය නිලධාරීන් විදේශගතවීම, ඡන්ද විමසීම් කාර්යයට බාධාවිය හැකි බැවින් සාමාන්‍යයෙන් ඡන්ද විමසීම් කාල සීමාව තුළ නිලධාරීන්ගේ විදේශ ගමන් සඳහා අනුමැතිය ලබා දිය යුත්තේ අත්‍යවශ්‍යම හේතු ඇත්නම් පමණි. එසේ වුවද ඡන්ද විමසීම් කාල සීමාවේදී ශිෂ්‍යත්ව, උසස් අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර, වන්දනා ගමන් යනාදිය සඳහා සිදු කෙරෙන විදේශ ගමන් සීමා කිරීමට අපේක්ෂා නොකෙරේ. එබැවින් එවැනි අවශ්‍යතා සඳහා නිලධාරීන් විදේශ ගතවීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නැත. කෙසේ වුවද නිලධාරීන් සමූහ වශයෙන් මෙම කාලය තුළ විදේශ ගත වන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වේ. ඉතා හදිසි හා කල් තැබිය නොහැකි හේතු නිසා විදේශගතවීම් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අනුමැතිය දීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි අවස්ථා සම්බන්ධයෙන් වූ ඉල්ලීම් කල්වේලා ඇතිව ඉදිරිපත් කිරීම යෙහෙකි.

(v) ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් 2020.03.03 වන දින සිට ඡන්ද විමසීම් අවසන් වී සති 02ක් ගතවනතුරු එනම් 2020.05.19 දක්වා අත්හිටුවිය යුතුය.

(vi) කිසියම් විශේෂිත අත්‍යවශ්‍ය කරුණක් හේතුවෙන් (එනම්, විනය ක්‍රියාමාර්ග, නිලධාරියාගේ ඉල්ලීම මත සානුකම්පිතව ක්‍රියා කිරීමට සිදුවීම, යම් කිසි පාඨශාලාවකට අත්‍යවශ්‍ය ගුරුවරුන් ලබා දීම වැනි කරුණු හේතුවෙන්) නිලධාරීන් / ගුරුවරුන් / විදුහල්පතිවරුන් ස්ථාන මාරු කිරීමට සිදුවන විට එම මාරු කිරීම් දේශපාලනමය සිද්ධීන් නිසා කරනු ලබන මාරුවීම් නොවන බවට සනාථ කළ හැකි නම් නැතහොත් ඒ සම්බන්ධයෙන් පැමිණිලි / චෝදනා නොලැබේ නම් එවැනි මාරුවීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව දැනුවත් කරනු ලැබූ පසු ඒ සඳහා අනුමැතිය ලබා දිය හැකිය.

10. රාජ්‍ය දේපල විශේෂයෙන්ම රජයේ ආයතන, වාහන, බඩු බාහිරාදිය, ගොඩනැගිලි, ඉඩම් හා නිලධාරීන් ඡන්ද විමසීමට අදාළ පක්ෂ/ කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමට කිසිදු අවකාශයක් නොදිය යුතු ය. ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශවල හදිසි රාජකාරී කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා (නැතහොත් අගතියට පත්කිරීම සඳහා) රජයේ/ රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ/ රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන වෙනත් කාර්යාලවලට හා ආයතනවලට අනුයුක්ත කිරීම් හෝ මුදාහැරීම් හෝ වැනි අකටයුතුකම් සිදුකිරීමට කිසිදු නිලධරයෙකුට ඉඩ නොදිය යුතු ය. රජයේ, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල හෝ රාජ්‍ය සංස්ථා, මණ්ඩල, රාජ්‍ය බැංකු, ව්‍යවස්ථාපිත වෙනත් ආයතන, රජයේ විශ්ව විද්‍යාල යනාදී කිසිදු රාජ්‍ය ආයතනයක් සතු මාධ්‍ය ඒකකවලට අයත් නිලධාරීන්, වාහන, උපකරණ කිසිදු පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතු ය. සාමාන්‍ය තත්ත්වය යටතේ යම් රාජ්‍ය ආයතනයක් සතු වේදිකා, සැරසිලි කිරීම්, උපකරණ, වාහන, ගුවන් යානා, හෙලිකොප්ටර් යානා කුලී පදනම මත ලබා දෙන්නේ නම් ඡන්ද විමසීම් කාලය තුළ එවැනි කුලියට දීම් සියලුම පක්ෂ/ කණ්ඩායම් සඳහා ලබා ගැනීමේ අවස්ථා සහිතව විනිවිදභාවයකින් යුතුව ඉටුකළ යුතු ය.

11. (i) ඡන්ද විමසීම් කාලය තුළ විශේෂ නැතහොත් කඩිනම් විවිධ ව්‍යාපෘති, ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් යනාදිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. ඡන්ද විමසීම් කාලය තුළ සිදුකරන මෙවැනි අඛණ්ඩ වැඩසටහන් හා ව්‍යාපෘති හරහා පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදුකරන්නේ ද යන්න මැතිවරණ කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

(ii) රජයේ සංවර්ධන කටයුතු පිළිබඳව හෝ යම්කිසි සංවත්සර/ අනුස්මරණ උත්සව ආදිය සඳහා හෝ ප්‍රචාරක කටයුතු සිදුකිරීම පිණිස රාජ්‍ය මුදල් වැය කරමින් රූපවාහිනී, ගුවන්විදුලි, ප්‍රවෘත්ති පත්‍ර යනාදී මාධ්‍ය හරහා දැන්වීම් විකාශය කිරීම්/ පළකිරීම් මගින් හෝ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම මගින් හෝ කිසිදු පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයෙකු වෙනුවෙන් ප්‍රවර්ධන කටයුතු හෝ අගතියට පත්කිරීමේ කටයුතු සිදුනොකළ යුතු ය.

12. සියලුම පෞද්ගලික කේබල් රූපවාහිනී නාලිකා, පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන, වෙබ් අඩවි, ජංගම හා ස්ථාවර දුරකථන සේවා සපයන ආයතන ඡන්ද විමසීම් කාලසීමාවේ දී මැතිවරණ නීති උල්ලංඝනය නොවන පරිදි සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කොට ඇති මාධ්‍ය උපමාන, විධාන හා උපදෙස් චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියා කරන බවට වගබලා ගැනීම උක්ත සන්නිවේදන ආයතන නියාමනය කිරීමේ වගකීම පවතින ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම විය යුත්තේ ය.

**13.** පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත්වන අයුරින් වීදි පහන් කණු හා දුරකථන රැහැන් කණුවල බැනර්, පෝස්ටර්, ධජ, පතාක ප්‍රදර්ශනය හා වෙනත් සැරසිලි කිරීම වැළැක්වීම මෙන්ම පොදු මහාමාර්ග මත සහ දෙපස පදික වේදිකා මත පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය වන හෝ අගතියට පත්වන අයුරින් තීන්ත ආලේප මගින් හෝ ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික පුවරු වැනි හෝ ප්‍රචාරක කටයුතු සිදු වීම වැළැක්වීමට අදාළ බල ප්‍රදේශයේ එම රාජ්‍ය දේපළ සන්තකය හෝ පාලනය හිමි රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ/ පළාත් හෝ ප්‍රාදේශීය ප්‍රධානීන්ගේ හා නගරාධිපති/ සභාපති/ නාගරික කොමසාරිස්/ ලේකම් සහ ඒ ඒ අංශ ප්‍රධානීන්ගේ වගකීම වේ.

14. යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය ආයතනයක් විසින් මැතිවරණ කාලසීමාවට පෙර ඉදිකර ඇති හෝ ප්‍රදර්ශනය කරමින් පවතින පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනයට හේතුවිය හැකි අයුරින් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කෙරෙන ඡායාරූප, ප්‍රචාරණ පුවරු, ධජ, පතාක හා සැරසිලි යනාදිය මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කිරීමට එම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් ක්‍රියාකළ යුතු ය. ස්වකීය පළාත් පාලන බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානවල සිදුකර ඇති පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය ප්‍රචාරණ පුවරු, ධජ, පතාක හා සැරසිලි යනාදිය ඉවත් කරවීමට පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා එකී ආයතනවල කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් ක්‍රියාකළ යුතු ය.

15. ඡන්ද විමසීමකදී පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම හෝ අගතියට පත් කිරීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපළ භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම විධානය කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළයුතු ය. ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා මණ්ඩල හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ක්‍රියා කළයුතු ය. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය ය.

16. මෙම ඡන්ද විමසීමේ දී අපේක්ෂකයන් හෝ ඔවුන් ඉදිරිපත් වී ඇති දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීමේ හෝ එවැනි යම් දේශපාලන පක්ෂයක්/ අපේක්ෂකයෙක්/ ස්වාධීන කණ්ඩායමක් අගතියට පත්වීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපල භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම තහනම කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළ යුතුය. තවද, ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා වෙනත් ආයතනවල ප්‍රධානින්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට ක්‍රියා කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය.

17. ඡන්ද විමසීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සහාය දැක්වීම අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය බව කාරුණිකව දන්වා සිටිනු කැමැත්තෙමි.

18. (i) මෙම චක්‍රලේඛ ලිපියේ සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුම්වත් කිරීම ද අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරෙන බව ද, පළාත් ආණ්ඩුකාරවරුන් දැනුම්වත් කිරීමේ වගකීම ආණ්ඩුකාරවර ලේකම්වරයා වෙත පැවරෙන බව ද, ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍ය ලේකම්වරුන් ද අදාළ වන පරිදි ආණ්ඩුකාරවරුන් දැනුම්වත් කළ යුතුය.

(ii) රාජ්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය ධුර පැවතීම පාර්ලිමේන්තුව විසරුවා හැරීමත් සමඟ අවසන් වන හෙයින් එම තනතුරු දැරූ මැති ඇමතිවරුන්ට ද ඔවුන්ගේ කාර්ය මණ්ඩලවලට ද කිසිදු රාජ්‍ය දේපලක් භාවිතා කිරීමේ අයිතියක් නැති බැවින්, එසේ සිදු කිරීම වැළැක්වීම අදාළ කැබිනට් අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීම වේ.

19. එමෙන්ම අදාළවන විට කොමිෂන් සභාවල ලේකම්වරුන් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් චක්‍රලේඛය පිළිබඳව දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතුවේ.

20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, ඔබේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නැතහොත් ගණන් දීමේ නිලධාරී වශයෙන් ද රජය සතු දේපල අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම ද අදාළ නිලධාරීන්ගේ වගකීමක් බව මෙහිලා සඳහන් කරමි.

21. මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව සුපුරුදු පරිදි පිළිගත් දේශපාලන පක්ෂ, සියලු නිරීක්ෂණ සංවිධාන දැනුම්වත් කරනු ලබනු ඇති අතර මැතිවරණ මහලේකම් කාර්යාලය හා සියලුම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මකවන මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන විසින් මෙහි සඳහන් කරුණුවලට අදාළව ලැබෙන පැමිණිලි ගැන විමර්ශනය කරනු ඇති බවත් ඡන්ද පෙත්සම්වල දී සහ අගතියටපත් පාර්ශව විසින් ගනු ලබන වෙනත් අධිකරණ ක්‍රියාමාර්ගවලදී මෙහි සඳහන් උපදෙස්වලට අනුකූල නොවන ක්‍රියා පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට අවකාශ ඇති බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**22. මැතිවරණ කොමිෂන් සභාවේ මෙම විධානවලට අනුකූල වීමට අපොහොසත් වීම වරදක් වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උළ. ව්‍යවස්ථාව ප්‍රකාරව එවැනි වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයක් හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම යටත් විය යුතු බව අවධාරණය කරමි.**

23. මෙම උපදෙස් / නියෝග මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාවය මත නිකුත් කරනු ලැබේ.

24. මෙම විධානවල රජය යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකදී ම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු සියලු රජයේ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්ව විද්‍යාල, රජයට පවරා ගත් සමාගම් යන සියලුම ආයතන හා 50% කට වඩා කොටස් රජය හෝ රාජ්‍ය සමාගම් සතු ආයතන ද අදහස් වේ.

25. රජයේ නිලධාරීන් හා සේවකයන් යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකම පෙර සඳහන් ආයතනවල සේවයේ නිරත හා සේවයේ යොදවා ගෙන සිටින ජන රජයෙන් වේතනයක් හෝ දීමනාවක් ලබන සියලුම තැනැත්තන් අදහස් වේ.

**මහින්ද දේශප්‍රිය**
සභාපති/ මැතිවරණ කොමිෂන් සභාව.
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.)

පිටපත්:
1. ජනාධිපති ලේකම් - දැනගැනීම පිණිස
2. අග්‍රාමාත්‍ය ලේකම් / අමාත්‍ය මණ්ඩල ලේකම් - දැනගැනීම පිණිස
3. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - දැනගැනීම පිණිස
4. අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - දැනගැනීම පිණිස
5. සියලුම අමාත්‍යාංශවල පාලන විෂය භාර අතිරේක ලේකම්වරුන් - දැන ගැනීම පිණිස හා ක්‍රියා කිරීම සඳහා
6. සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් - මෙම ලිපියේ සඳහන් උපදෙස් හා නියමයන්ට එරෙහිව සිදුවන කටයුතු පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් නොපමාව මා වෙත වාර්තා කිරීම පිණිස හා එවැනි කටයුතු වළක්වාලීමට අවශ්‍ය පියවර ගැනීම පිණිස

7. ත්‍රිවිධ හමුදාපතිවරුන් / සිවිල් ආරක්ෂක බලකායේ අණ දෙන නිලධාරී
 - දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා

8. පොලිස්පති - දැන ගැනීම පිණිස සහ ඡන්ද විමසීම් නීති බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම් වස්.

9 .මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
 - දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා

10.සියලුම දිස්ත්‍රික්ක නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්
 - දැන ගැනීම සඳහා සහ ඔබ දිස්ත්‍රික්කයේ සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ නාගරික කොමසාරිස්වරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත මෙම ලිපියේ පිටපතක් යැවීම සඳහා සහ එහි සඳහන් ආකාරයට කටයුතු කරන ලෙස දැන්වීම පිණිස

11. මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය හා එක්ව ක්‍රියා කරන පිළිගත් දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන් හා නිරීක්ෂණ සංවිධානවල ප්‍රමුඛ නිලධාරීන් වෙත
 - දැන ගැනීම පිණිස